// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1767/27 - 2012 ජූලි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2012.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

**ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 11 දරන ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2011 අප්‍රේල් මස 05 වන දින සම්මත කරන ලදුව 2012 ජුනි මස 18 වන දින ඌව පළාත්, ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ලේකම්,
ඌව පළාත් සභාව,

2012 ජූලි මස 04 වන දින,
බදුල්ල රජ වීදියේ පිහිටි ඌව සභා ලේකම් කාර්යාලයේ දී ය.

**2011 අංක 11 දරන ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශ ප්‍රඥප්තිය**

පූර්විකාව

ඌව පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පුළුල් බලතල සහිත කාර්යාංශයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද ඒ කාර්යාංශයේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිශ්චය කොට දැක්වීම පිණිසද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද පනවනු ලබන ප්‍රඥප්තියකි.

ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩුනාමය ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2011 අංක 11 දරන ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

---

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - PG 0011374— 340 (2012/07)

I කොටස

**ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය පිහිටුවීම හා එහි සංයුතිය**

ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය කාර්යාංශය පිහිටුවීම.

2. (1) මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය මෙයින් පිහිටුවනු ලැබේ.

(2) ඌව පළාතේ ඉදිකිරීම් හා ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකිය.

(3) මෙහි මින් මතු "අමාත්‍යවරයා" යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාතේ පළාත් සභාවේ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මෙම කාර්යාංශය යටතේ ශාඛා කාර්යාල, අංශ හෝ ඒකක පිහිටුවා පවත්වාගෙන යා හැකිය.

කාර්යාංශයේ අරමුණු.

3. මෙම කාර්යාංශය පිහිටුවීමේ අරමුණ පහත ආකාරයෙන් විය යුතුය.

(1) ඌව පළාතේ යටිතල පහසුකම් සංවර්ධය කිරීමට දායක කර ගැනීම.

(2) පළාතේ විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මානව, භෞතික, සම්පත් හා උපදේශාත්මක සේවාවන් ලබාගැනීම.

(3) පළාත තුළ හා ඉන් බැහැරව ක්‍රියාත්මක වෙමින් පළාත් සභාව වෙත ආදායම් උපයාදීම.

(4) පළාත තුළ රැකියා ජනනය කිරීමට දායක කර ගැනීම.

(5) පළාත තුළ ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් හා තාක්ෂණික දැනුම ලබාදෙන සංචිතයක් ලෙස ක්‍රියාකිරීම.

කාර්යාංශයේ පාලක සභාව හා එහි සාමාජිකයන්.

4. (1) කාර්යාංශය සඳහා හත් දෙනෙකුගෙන් යුත් පාලක සභාවක් පත් කළ යුතු අතර, එය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විය විය යුතුය.

(අ) පරිපාලනය, ගණකාධිකරණය, ඉංජිනේරු විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් පිළිබඳ පළපුරුද්දක් හා නිපුනත්වයක් දක්වා ඇතැයි අමාත්‍යවරයාට සෑහීමකට පත්විය හැකි තැනැත්තන් (මෙහි මින් මතු පත්කළ සාමාජිකයන් ලෙස හඳුන්වනු ලබන) තුන්දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය. එම තිදෙනාට අමතරව,

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම්, මාර්ග, වාරිමාර්ග හා මූල්‍ය යන ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු ඌව පළාත් සහා රාජ්‍ය සේවයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් (මෙහි මින් මතු නම් කළ සාමාජිකයන් ලෙස හඳුන්වනු ලබන) හතර දෙනෙකුද අමාත්‍යවරයා විසින් පාලක සභාවේ සාමාජිකයන් ලෙස නම් කළ යුතුය.

කාර්යාංශයේ සභාපති.

(2) පත් කළ සාමාජිකයන් අතරින් එක් අයෙකු අමාත්‍යවරයා විසින් පාලක සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතුයි.

නුසුදුසු අය.

(3) පළාත් පාලන ආයතනයක් හෝ පළාත් සභාවක් හෝ පාර්ලිමේන්තුව නියෝජනය කරන නියෝජිතයකු මෙම පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම හෝ නම් කිරීම නොකළ යුතු අතර, පත්කරන ලද හෝ නම් කරන ලද සාමාජිකයෙකු තමා එම පාලක සභාවේ සාමාජිකත්වය දරමින් සිටින අවස්ථාවක කිසියම් පළාත් පාලන අයාතනයක හෝ පළාත් සභාවක හෝ පාර්ලිමේන්තුවේ නියෝජිතයෙකු ලෙස තෝරා පත් කරනු ලැබුවහොත් එසේ තෝරා පත්කිරීම කළ දින සිට එකී සාමාජිකයා තවදුරටත් මෙම පාලක සභාවේ සාමාජිකත්වය දැරීමට සුදුස්සෙකු නොවිය යුතුය.

(4) යම් තැනැත්තෙකු පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට පෙර පාලක සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ තැනැත්තා විසින් ඔහුගේ කාර්තව්‍ය ඉටු කිරීමේදී එම කටයුතුවලට හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති කිසිදු මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවයක් ඒ තැනැත්තාට නොමැති බවට, අමාත්‍යවරයා සෑහිමකට පත්විය යුතුය. තවද පාලක සභාවේ කිසිදු සාමාජිකයෙකුට එවැනි සම්බන්ධතාවක් නොමැති බවට අමාත්‍යවරයා කලින් කලට සෑහීමට පත්විය යුතුය. මෙම උපවගන්තිය යටතේ සිය කාර්යය තමන්

විසින්ම ඉටු කරනු ලැබීම සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකන තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ විටෙක ඒ තොරතුරු පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත්කරන තැනැත්තෙකු විසින් හෝ ඒ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට අමාත්‍යවරයා අදහස් කර සිටින යම් තැනැත්තෙකු විසින් හෝ අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය යුතුය.

(5) පාලක සභාවේ කිසියම් සාමාජිකයෙකු කාර්යාංශය විසින් ඇති කර ගන්නා ලද හෝ ඇති කර ගැනීමට යෝජිත හෝ ගිවිසුම් පිළිබඳව, කෙලින්ම හෝ ඉන් අයුරකින් කිසියම් සම්බන්ධතාවයක් ඇති බව හෙළිදරව් වුවහොත් එකී සාමාජිකයා කාර්යාංශයේ පාලක සභාවේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයා පහත (8) වන උපවගන්තියේ පරිදි කටයුතු කළ යුතුය.

(6) පාලක සභාවට පත් කළ සෑම සාමාජිකයෙකුම, ඔහු පත්කරනු ලැබූ දිනයේ සිට ගැනෙන හා ඔහු පත්කරනු ලබන අවස්ථාවේ අමාත්‍යවරයා විසින් තීරනය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවූ කාලයක් (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ධූරය දැරිය යුතු අතර (8) වන උපවගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු නොවිය යුතුය. තවද, පත් කළ සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලබන වෙනත් පත් කළ සාමාජිකයෙකු කලින් සිය තනතුර පුරප්පාඩු වුවහොත් මිස, ඔහුට කලින් එම ධූරය දැරූ සාමජිකයාගේ ධූර කාලයේ ඉතිරිව ඇති කාලය වෙනුවෙන් පමණක් ධූරය දැරිය යුතුය.

(7) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, පාලක සභාවේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේය.

(8) කවර හෝ පත්කළ සාමාජිකයෙකු, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් කිසිදු හේතුවක් නොදක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(9) පාලක සභාවේ සාමාජිකයෙකු සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති විටෙක ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයේදී ඒ සාමාජිකයාගේ ධූරකාලය හිස් විය යුතුය.

(10) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් පාලක සභාවේ පත්කල සාමාජිකයෙකුට සාමාජිකයෙකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධූරයෙන් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකිය.

(11) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ පාලක සභාවේ නම් සාමාජිකයෙකු ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක 4(1) උප වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තෙකු එහි සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා පත් කළ හැකිය.

(12) පාලක සභාවේ සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධූරයේ කටයුතු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක වෙනත් යම් පත්කළ සාමාජිකයෙකු සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(13) පාලක සභාවේ ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය, මරණය, ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ කාලය ඉකුත් වීම හෝ නිසා අවසන් වන්නේය.

5. කාර්යාංශයේ පාලක සභාවේ සියලුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවෙකුට අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික දීමනා හා වෙනත් වියදම් කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. *සාමාජිකයින්ගේ පාරිශ්‍රමික දීමනා.*

6. (1) පාලක සභාවේ සභාපතිවරයා පැමිණ සිටින පාලක සභාවේ සෑම රැස්වීමකම මූලාසනය, ඔහු විසින් දැරිය යුතුය. පාලක සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටෙක පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන යම් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය. *පාලක සභාවේ කාර්යය පටිපාටිය.*

(2) පාලක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක රැස්විය යුතුය.

(3) පාලක සභාවේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) පාලක සභාවේ යම් රැස්වීමක් සඳහා වූ සණපුරණය සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(5) පාලක සභාවේ සාමාජිකයන් අතර. යම් පුරප්පාඩුවක් තිබිය දී වුවත් පාලක සභාවට ක්‍රියා කළ හැකිය. පාලක සභාවේ සාමාජිකයින් අතර, යම් පුරප්පාඩුවක් තිබීම හෝ යම් සාමාජිකයෙකු පත් කිරීමේ හෝ නම් කිරීමෙහිලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොට ගෙන පාලක සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ නිර්බල නොවන අතර, නිර්බල සේ සලකනු නොලැබිය යුතුය.

(6) (අ) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව පාලක සභාවේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය සඳහා ඒ පාලක සභාව විසින් රීති සාදනු ලැබිය හැකිය.

(ආ) පාලක සභාව විසින් එසේ සාදනු ලබන රීති අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතුය.

කාර්යාංශයේ මුද්‍රාව.

7. (1) කාර්යාංශයේ නිල මුද්‍රාව පාලක සභාවේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) පාලක සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට කාර්යාංශයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) එක් අයෙකු පාලක සභාවේ සභාපතිවරයා වන්නා වූ පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කාර්යාංශයේ මුද්‍රාව තබනු නොලැබිය යුතුය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

## II කොටස

### කාර්යාංශයේ බලතල හා කාර්ය හා කර්තව්‍ය

කාර්යාංශයේ බලතල කාර්යය හා කර්තව්‍ය

(8) (1) ඌව පළාත තුළ හෝ ඉන් බැහැර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන සිවිල් හෝ යාන්ත්‍රික හෝ විදුලි හෝ විද්‍යුත් හෝ ඕනෑම ආකාරයක ඉංජිනේරුමය ස්වභාවයක් ගන්නා සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම, ප්‍රගති පාලනය කිරීම. අධීක්ෂණය කිරීම, ඒ සඳහා අවශ්‍ය උපදෙස් දීම සහ එවැනි ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය කරන වාර්තා සකස් කිරීම හා අවශ්‍ය පරිදි එම වාර්තා ඉදිරිපත් කිරීම,

(2) යම් ලිඛිත නීතියක සඳහන් කොන්දේසිවලට යටත්ව ඉහත (1) උප වගන්තියේ සඳහන් සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ඌව පළාත තුළ හෝ ඉන් බැහැර යම් තැනැත්තෙකු සමග අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කෙළින්ම හෝ හවුල් ව්‍යාපාරයක ස්වරූපයෙන් හෝ ඇතුළත් වීම, ඒවා ඉටු කරවා ගැනීම හා කරගෙන යාම,

(3) ඉහත (1) උප වගන්තියේ සඳහන් යම් සංවර්ධන ව්‍යාපෘතියක්, වැඩසටහනත් කර්මාන්තයක් හෝ කාර්යයක් නිම කිරීමට අපොහොසත් වන හෝ පැහැර හරින තැනැත්තකු හෝ තැනැත්තන් පිළිබඳව නීතිමය කටයුතු කිරීම හා එකී ව්‍යාපෘතිය, වැඩසටහන කර්මාන්තය හෝ කාර්යය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම,

(4) අමාත්‍යවරයා විසින් අනුමත කරණු ලබන සැලසුම් හා මූලධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම,

(5) ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ හෝ වෙනත් පළාත් සභාවක හෝ වෙනත් පළාත් සභාවකට අයත් ආයතනයක හෝ රජයට අනුබද්ධ ආයතනයක හෝ ඉල්ලීම අනුව ඒ ආයතනය වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන්, කර්මාන්ත හෝ කාර්යයන්, සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම හෝ උපදෙස් දීම හෝ අන්‍ය ආකාරයකින් ඊට සහාය ලබාදීම,

(6) මෙම කාර්යාංශය වෙනුවෙන් සපයනු ලබන කවර හෝ සේවාවක් සඳහා ගාස්තු අයකිරීම,

(7) මුදලින් හෝ ද්‍රව්‍යමය ස්වරූපයෙන් හෝ උපකරණ ලෙස හෝ ප්‍රදාන, ආධාර පරිත්‍යාග භාර ගැනීම හා කාර්යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඒවා උපයෝගි කර ගැනීම,

(8) යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලට ගැනීම හෝ එසේ මිලට ගත් දේපලක් බැහැර කිරීම,

(9) කාර්යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නාවූ මානව හෝ භෞතික සම්පත් මිලට හෝ, කුලී පදනම මත හෝ බද්දට හෝ වෙනත් ආකාරයකින් ගාස්තුවක් ගෙවීමේ පදනමක් මත සපයා ගැනීම,

(10) මේ ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් තම වගකීම් ඉටු කිරීම සඳහා කාර්යාංශයට අවශ්‍ය වන මුදල්, අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය ඇතිව අමාත්‍යවරයා විසින් ලබාදෙන නියමයන්ට අනුකූලව අයිරාවක් මගින් හෝ අන්‍ය ආකාරයකින් හෝ රාජ්‍ය බැංකුවකින් හෝ රජයට අනුබද්ධිත මූල්‍ය ආයතනයකින් ගැනීම,

(11) රජයට හෝ රාජ්‍ය අනුබද්ධිත ආයතනයකට හෝ පළාත් සභාවට හෝ වෙනත් පළාත් සභාවකට අයත් ඉඩම්වල භුක්තිය භාර ගැනීම හා එම ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.

(12) කාර්යාංශය විසින් ස්වකීය බලතල කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි, ඉටු කිරීමෙහි හා කිරීමෙහිලා යම් සංවර්ධන ව්‍යාපෘති, කර්මාන්ත, වැඩසටහන් හෝ කාර්යයන් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට යෝජිත වැඩකටයුතුවලට ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ හෝ වෙනත් පළාත් සභාවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ මණ්ඩලයක අයිතිවාසිකම්, සම්බන්ධතා හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේද අවස්ථාවෝචිත පරිදි ඒ අදාළ ආයතනය විමසා ඒවා සකස් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කාර්යාංශයේ කාර්යයක් වන්නේය.

(13) මෙම ප්‍රඥප්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම.

(14) මේ ප්‍රඥප්තිය යටතේ පෙන්වා දී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ඉටු කිරීමට හා ඒ හා සම්බන්ධ ප්‍රශාංගික හෝ ආනුෂාංගික වන්නාවූ සියලු ක්‍රියා හෝ දේවල් කිරීම කාර්යාංශයේ බලතල, කාර්ය හා කර්තව්‍ය විය යුතුය.

9. කාර්යාංශය විසින් ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි, ඉටුකිරීමෙහිලා යම් සංවර්ධන ව්‍යාපෘති, කර්මාන්ත, වැඩසටහන් හෝ කාර්යයන් ක්‍රියාත්මක කරන විට යම් පළාත් පාලන ආයතනයකට හෝ වෙනත් ආයතනයක මැදිහත් වීමක් අවශ්‍ය වන්නේ නම් කාර්යාංශය විසින් සංවිධානය කරනු ලබන රැස්වීම්වලට හෝ වැඩසටහන්වලට එකී පළාත් පාලන ආයතනයේ හෝ වෙනත් ආයතනයේ ප්‍රධානියාට නැතහොත් විධිමත් ලෙස බලයලත් එම පළාත් පාලන ආයතනයේ හෝ වෙනත් ආයතනයේ නිලධාරියෙකුට ආරාධනා කිරීම කාර්යාංශයේ කාර්යයක් වන්නේය. එවැනි ආරාධනාවක් ලද පළාත් පාලන ආයතනයක හෝ වෙනත් ආයතනයක ප්‍රධානියකු හෝ බලයලත් නිලධාරියෙකු එම ආරාධනාව පරිදි එකී රැස්වීම්වලට හෝ වැඩසටහන්වලට සහභාගි විය යුතුය.

10. (1) කාර්යාංශය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්යය ඉටු කිරීම පිළිබඳ අමාත්‍යවරයා විසින් කලින් කළ කාර්යාංශයට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර, කාර්යාංශය විසින් ඒ විධාන බලාත්මක කළ යුතුය. අමාත්‍යවරයාගේ විධාන.

(2) කාර්යාංශයේ දේපළ හා කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කාර්යාංශයට කළින් කළ ලියවිල්ලකින් විධාන කළ හැකි අතර. කාර්යාංශය විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කළ යුතුයි.

කාර්යාංශයේ බලතල ආදිය පැවරීම.

11. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය වෙත පවරා ඇති බලතල කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ වගකීම කාර්යාංශයේ පාලක සභාව සතු වන්නේය. පාලක සභාව විසින් කාර්යාංශයේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතුරෙන් කිසිවක් සභාපතිවරයාට හෝ යම් නිලධාරියෙකුට ලියවිල්ලක් මඟින් පැවරිය හැකිය.

## III කොටස

### කාර්යාංශයේ කාර්ය හා මණ්ඩලය

කාර්යාංශයේ සාමාන්‍යාධිකාරීවරයා.

12. (1) ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා විසින් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව කාර්යාංශය සඳහා සාමාන්‍යාධිකාරීවරයෙකු පත්කරනු ලැබිය යුතුය.

(2) කාර්යාංශයේ වැඩකටයුතු මෙහෙයවීමද, කාර්යාංශයේ බලතල, කාර්යය හා කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීමද, කාර්යාංශයේ සේවා නියුක්තියන් පිළිබඳව පරිපාලනය හා විනය පාලනයද, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටද පාලක සභාවේ සාමාන්‍ය විධිවිධානවලට යටත්ව සාමාන්‍යාධිකාරී වරයාට භාර කරනු ලැබිය යුතුය.

(3) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්යය අතුරින් කිසිවක් කාර්යාංශයේ වෙනත් යම් සේවා නියුක්තිකයෙකුට පැවරීම අවශ්‍ය යැයි සාමාන්‍යාධිකාරීවරයා අදහස් කරන්නේ නම් එකී බලතල, කර්තව්‍ය හෝ කාර්යය පාලක සභාවේ අනුමැතිය ඇතිව වෙනත් යම් සේවා නියුක්තිකයෙකුට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තිකයෙකු විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරීවරයා ධුරයෙන් ඉවත්කරනු නොලැබිය යුතුය.

කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය.

13. (1) කාර්යාංශයේ සභාපතිවරයා විසින් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා විමසා මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්නට යටත්ව,

(අ) කාර්යාංශයේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා පාලක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කාර්යය මණ්ඩලයක් පත්කිරීම, සේවයෙන් පහකිරීම හා කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම ;

(ආ) ඒ කාර්යය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි තීරණය කිරීම ; - සහ

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම කළ හැකිය.

(2) කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව කාර්යාංශයේ ඉල්ලීම පිට පළාත් සභා රාජ්‍ය සේවයක හෝ රජයේ සේවයේ යම් නිලධාරියෙකු එම නිලධාරියාගේද, එම නිලධාරියා සේවයේ නියුක්ත කරනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින්ද, නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද, විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව පාලක සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයන් සඳහා කාර්යාංශයේ කාර්යය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්යය මණ්ඩලයට ස්ථිරවම පත්කරනු ලැබිය හැකිය.

(3) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට හෝ පළාත් සභාවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව හෝ පළාත් සභාව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තෙකු කාර්යාංශය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා කාර්යාංශයට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට හෝ පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතුය.

## IV කොටස

### මුදල්

14. (1) කාර්යාංශයට කාර්යාංශයේම නමින් අරමුදලක් තිබිය යුතුය. එම අරමුදලේ ගිණුම රජයට අනුබද්ධිත බැංකුවක පවත්වාගෙන යා යුතුය. කාර්යාංශයේ අරමුදල.

(2) කාර්යාංශයේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය, අරමුදලෙන් කරනු ලබන ගෙවීම්.

(අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා ඌව පළාත් සභාව විසින් වරින්වර සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) ස්වකීය බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, ඉටුකිරීමේදී, කිරීමේදී කාර්යාංශයට ලැබෙන සියලුම මුදල් ප්‍රමාණයන් ; සහ

(ඇ) කාර්යාංශයේ බැරට උපචිත වන සියලු මුදල්.

(3) මෙම ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කාර්යාංශයේ බලතල හා කටයුතු කළමනාකරණය කිරීම, කාර්යාංශයේ කටයුතු ක්‍රියාත්මක කරගෙන යාම. පාලක සභාවේ සාමාජිකයින්ට හා කාර්යාංශයේ සේවා නියුක්තිකයන්ට පාරිශ්‍රමික ගෙවීම, කාර්යාංශයේ ගෙවීම්, කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යය සහ කාර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් දරණු ලබන යම් වියදම් ගෙවීමේ කාර්යය සඳහා කලින් කළ කාර්යාංශය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්යය සඳහා කාර්යාංශය විසින් කාර්යාංශයේ මුදල් උපයෝගි කරගත හැකිය.

(4) කාර්යාංශයේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් විසිපන් ලක්ෂයකට නොඅඩු විය යුතුය. ආරම්භක ප්‍රාග්ධනයේ මුදල් ප්‍රමාණය, මුදල් විෂය භාර පළාත් සභා අමාත්‍යවරයා විසින් විෂය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරන වාරිකවලින් පළාත් සභා අරමුදලින් ගෙවිය හැකි අතර, ඒ මුදල් ඉහත (1) වන උප වගන්තිය යටතේ පිහිටවනු ලැබූ අරමුදලට බැර කළ යුතුය.

15. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශයේ කාර්යය ඉටුකිරීමේදී සිය වගකීම ඉටුකිරීම සඳහා කාර්යාංශයට අවශ්‍ය වනු ලබන මුදල්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව අයිරායවන් මඟින් හෝ අන්‍යාකාරයකින් හෝ කාර්යාංශය විසින් තාවකාලිකව ණයට ගත හැකිය. කාර්යාංශයේ ණය ලබා ගැනීමේ බලතල.

එසේ වුවද කාර්යාංශය විසින් මේ වගන්තිය යටතේ ලබාගන්නා ලද යම් තාවකාලික ණය මුදලක් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුලු මුදල කිසිම අවස්ථාවකදී අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණය නොඉක්ම විය යුතුය.

16. (1) කාර්යාංශයේ මුදල් වර්ෂය සෑම වසරකම ජනවාරි මස පළමු වැනි දින සිට එම වසරේ දෙසැම්බර් මස තිස්එක් වැනිදා දක්වා විය යුතුය. කාර්යාංශයේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

(2) කාර්යාංශයේ ආදායම හා වියදම වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට කාර්යාංශය විසින් සලස්වනු ලැබිය යුතුය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීමේ වගකීම භාර දීමට ප්‍රථමයෙන් ආණ්ඩුවේ සහ විගණකාධිපතිවරයාගේ එකඟතාවය ලබාගත යුතුය යන කොන්දේසියට යටත්ව, කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

V කොටස

**පොදු විධාන**

රීති සෑදීමට කාර්යාංශයට බලතල ඇති බව.

17. (1) කාර්යාංශයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ රීති සෑදීමට මෙම ප්‍රඥප්තියේ බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ මෙහි පහත සඳහන් සියලුම කාරණා හෝ ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් හෝ කාර්යාංශය විසින් රීති සෑදිය හැකිය.

(අ) ප්‍රාග්ධනය ආයෝජනය කිරීම පිළිබඳව,

(ආ) ණය ලබා ගැනීම හා ඊට අදාළ කොන්දේසි නියම කිරීම පිළිබඳව,

(ඇ) ගිවිසුම් සකස් කිරීම, ගිවිසුම් සඳහා අවශ්‍ය කොන්දේසි ඇතුළත් කිරීම හා ගිවිසුම් අත්සන් කිරීම පිළිබඳව,

(ඈ) අරමුදල් පිහිටුවීම, ඒ සඳහා ආදායම් රැස්කිරීම, ඒවාට අවශ්‍ය දායකත්වය ලබා ගැනීම හා අරමුදලේ පරමාර්ථ නිශ්චය කිරීම පිළිබඳව,

(ඉ) මූල්‍ය කළමනාකරණය, මූල්‍ය බලතල හා සීමාවන් තීරණය කිරීම හා පැවරීම පිළිබඳව,

(ඊ) මුදල් ගෙවීම සඳහා විධිවිධාන පැනවීම පිළිබඳව,

(උ) අලාභ තක්සේරු කිරීම පිළිබඳව,

(ඌ) භාණ්ඩ අපහරණය හා වෙන්දේසි කිරීම පිළිබඳව,

(එ) අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳව,

(ඒ) අභ්‍යන්තර පරිපාලන කටයුතු පිළිබඳව,

(ඔ) සේවකයින් බඳවා ගැනීම, වැටුප් හා දීමනා තීරණය කිරීම, සේවය අත්හිටුවීම හා සේවයෙන් ඉවත් කිරීම පිළිබඳව,

(ඕ) රාජකාරි උපදෙස් පිළිනොපැදීම හා පාලක සභාවේ තීරණ හෝ නියෝග ක්‍රියාත්මක නොකරන අය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව,

(ක) සේවාවන් ලබාදීමේදී හෝ ලබා ගැනීමේදී මිල ගණන් තීරණය කිරීම පිළිබඳව,

(ග) රැස්වීම් සඳහා කාර්ය පරිපාටි තිරණය කිරීම පිළිබඳව,

(ජ) පවත්වාගෙන යායුතු පොත්පත්, වාර වාර්තා, ලේඛන, ප්‍රගති වාර්තා, සකස් කිරීම පිළිබඳව,

(ට) ආරවුලකදී බේරුම්කරුවන් පත් කිරීම හා බේරුම් කිරීමේ කාර්යයේදී අනුමගමය කළ යුතු කාර්යය පරිපාටි තීරණය කිරීම පිළිබඳව,

(ඩ) අභියාචනා ඉදිරිපත් කිරීම, විභාග කිරීම හා තීරණ දැනුම්දීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි තීරණය කිරීම පිළිබඳව,

(ත) කාර්යාංශයේ පරිපාලනය, කළමනාකරණය, අභිවෘද්ධිය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් ඕනෑම කාරණයක් සමබන්ධව ක්‍රමවේද, කාර්ය පරිපාටි, කොන්දේසි, තීරණය කිරීම පිළිබඳව.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් සාදනු ලබන රීති සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

(3) ඉහත (2) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන රීති ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු එහි සඳහන් සෑම රීතියක්ම මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු සහ බල සහිත විය යුතුය.

18. (1) කාර්යාංශයේ වැඩ කටයුතුවල කාර්යය සඳහා යම් නිශ්චල දේපලක් අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ සහ අමාත්‍යවරයා එම යෝජිත අත්කරගැනීම අනුමත කරන්නා වූ අවස්ථාවක ඒ දේපල පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය දේපලක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ හෝ ඌව පළාතේ පළාත් සභාවේ ඊට අනුරූප ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පත් කරගෙන කාර්යාංශයට පවරා දෙනු ලැබිය හැකිය. එවැනි යම් අත්කර ගැනීමක් සඳහා ගෙවිය යුතුවන යම් මුදලක් කාර්යාංශය විසින් ගෙවිය යුතුය. ඉඩම් අත්කර ගැනීම.

(2) ඌව පළාත ඇතුළත පිහිටි යම් රජයේ ඉඩමක් කාර්යාංශයේ කිසියම් කාර්යයක් සඳහා අවශ්‍ය වන්නා වූ අවස්ථාවක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ II පරිශිෂ්ඨයේ 1.1.2 වගන්තිය අනුව පළාත් සභාව වෙත භාරගෙන, පළාත් සභාව විසින් කාර්යාංශයේ අවශ්‍යතාවය සඳහා කාර්යාංශය වෙත භාරදිය යුතුය. කාර්යාංශය විසින් එම ඉඩම අදාළ කාර්යය සඳහා යොදා ගත යුතු අතර, එකී අදාළ කාර්යය සඳහා අදාළ වන්නා වූ නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව එම ඉඩම පාලනය කිරීම, පරිපාලනය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම කාර්යාංශය විසින් සිදුකළ යුතුය.

19. පාලක සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත යටත් පිරිසෙයින් ලියවිල්ලකින් වූ දින තුනක දැනුම්දීමක් කිරීමෙන් පසුව ඒ ඉඩමට හෝ ස්ථානයට ඇතුල්වීම සහ එහිදී කාර්යාංශයේ යම් වැඩක් කරගෙන යාමේ හෝ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමේ හෝ යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි ක්‍රියාවක් කිරීම නීත්‍යානුකූල වන්නේය. යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුල්වීම සඳහා බලය.

20. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක්, විධිවිධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බණ්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය. වැරදි හා දණ්ඩන.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි ; අර්ථ දැක්වීම.

"පළත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාවද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයාද,

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යවරයාද,

"ප්‍රධාන ලේකම්" යන්නෙන් ඌව පළාතේ ප්‍රධාන ලේකම් හෝ විධිමත්ව පත්කරනු ලැබ, තත් කාලයෙහිදි එකී තනතුරේ කාර්යය හා කර්තව්‍ය ඉටු කරන තැනැත්තෙකුද,

"විෂය භාර ලේකම්" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ ඉදිකිරීම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ විධිමත්ව පත්කරනු ලැබ තත් කාලයෙහිදී එකී තනතුරේ කාර්යය හා කර්තව්‍ය ඉටු කරන තැනැත්තෙකුද,

"කාර්යාංශයේ සභාපතිවරයා" යන්නෙන් කාර්යාංශයේ පාලක සභාවේ සභාපතිවරයාද,

"පළාත් පාලන ආයතනය" යන්නෙන් ඌව පළාතේ මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් හෝ එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන හා කරන බලතලවලට, කාර්යයන්ට හා කර්තව්‍යයන්නට අනුරූප වන හෝ සමාන බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ හෝ ඇති කරුණු ලැබූ හෝ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන්නා වූ යම් අධිකාරියක්ද,

"රාජ්‍ය සංස්ථාවක්" යන්නෙන් සමාගම් ආඥා පනත යටතේ හැර වෙන යම් කිසි ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නාවූද, ආණ්ඩුව හෝ පළාත් සභාව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූද, සංස්ථාවක් මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක්ද අදහස් වේ.

අනනුකූලතාවයකදී සිංහන භාෂා පාඨය බලපවත්වන බව.

22. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨයන් අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

08 - 123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.